www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමා නිදහස් අධ්‍යාපනයට එල්ල කරන ප්‍රහාරය

## Obama's assault on public education

**2010 මාර්තු 4**

රෝඩ් අයිලන්ඩ්හි උසස් පාසලක ගුරු කාර්ය මන්ඩලය රැකියාවෙන් නෙරපීම සඳහා පාසල් පරිපාලනය ගත් තීන්දුවට ජනාධිපති ඔබාමා ප්‍රසිද්ධියේ සහාය පල කිරීම වනාහි සියලු ගුරුවරුන්ට ද සමස්ත කම්කරු පන්තියට ම ද එරෙහිව යුද්ධ ප්‍රකාශ කිරීමකි.

1981 දී පැට්කෝ ගුවන් සමාගමේ ගුවන් ගමන් පාලකයන් රැකියාවෙන් නෙරපා හැරීමට රොනල්ඩ් රීගන් පියවර ගැනීමෙන් මෙපිට කාලයෙහි, කිසි ම එක්සත් ජනපද ජනාධිපතිවරයෙකු කම්කරුවන් සමස්ත වශයෙන් බිලි ගැනීමේ තීන්දුවකට මෙතරම් ම එලිපිට සිය සහාය පල කර නැත. සෙන්ට්‍රල් ෆෝල්ස් උසස් පාසලෙහි ගුරුවරුන්ට එරෙහිව මැදිහත් වීමට ඔබාමා පෙලඹවෙන්නේ ද රීගන් පෙලඹවුනු ප්‍රතිගාමී අරමුනුවලින් ම ය.

මාර්තු 01 දින, එක්සත් ජනපද වානිජ මන්ඩලයෙහි පැවැත්වුනු ව්‍යාපාරික විධායකයන්ගේ සභාවක් හමුවේ කතා කල ඔබාමා, වැටුප් ගෙවීමකින් තොරව අතිරේක පැය ගනනක් වැඩ කිරීමට කල ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව සෙන්ට්‍රල් ෆෝල්ස් උසස් පාසලෙහි සමස්ත ගුරු සහ සහායක කාර්ය මන්ඩලය ම දොට්ට දැමීමට පාසල් පරිපාලනය ගත් තීන්දුවට සිය ප්‍රනාමය පුද කලේ ය.

ප්‍රධාන කොට ම රටේ දිලිඳුතම ප්‍රදේශවල ස්ථානගතව තිබෙන දේශයේ "අවම ක්‍රියාකාරිත්වයෙන් යුතු" පාසල් 5,000ක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා අධ්‍යාපන ලේකම් ආර්න් ඩන්කන් සකස් කල ජාතික මූලෝපාය ක්‍රියාවට නැංවීමෙහි ලා මෙවැනි පියවරයන් තීරනාත්මක වන්නේ යැයි පවසමින් ඔහු ඒවා ආරක්ෂා කලේ ය. යම් කිසි පාසලක් සඳහා ෆෙඩරල් අරමුදල් ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරනු පිනිස, පාසල් දිස්ත්‍රික්ක එක්කෝ එම පාසල මුලුමනින් ම වසා දමා එය බලපත්‍රලාභී පාසලකට හෝ පාසල් කලමනාකරන සමාගමකට පවරා ගුරුවරුන් මත දිගු පාසල් දිනයක් ද වෙනත් ප්‍රහාරයන් ද පැටවිය යුතු ය, නැත් නම් එම පාසලේ කාර්ය මන්ඩලය රැකියාවෙන් නෙරපා දමා ඉන් අඩක් පමනක් යලි කුලියට ගත යුතු ය.

සෙන්ට්‍රල් ෆෝල්ස්හි ගුරුවරුන් 74 දෙනා සහ අනෙක් පාසල් සේවකයන් 19 දෙනා ගැන කතා කරමින් ඔබාමා අවධාරනයෙන් කියා සිටියේ, ගුරුවරුන්ට "වගකීම් සහගත වීමට" සිදු වී ඇති බව යි.

එක්සත් ජනපද සහ ලෝක ආර්ථිකය බිඳ වැටීමේ මුව විටට රැගෙන ගිය වෝල් වීදියේ බැංකුකරුවන්ගෙන් නම් ධවල මන්දිරය මෙවන් ඉල්ලීම් කලේ නැත. ඔවුන්ගෙන් කිසිවෙකු නෙරපා දැමුනේ ද නැත. ඒ වෙනුවට සිදු වූයේ, තමන් වෙත ම වාර්තාගත මට්ටමේ ප්‍රසාද දීමනා පිරිනමා ගනු වස් එක්සත් ජනපද භාන්ඩාගාරයේ යතුරු කැරැල්ල ඔවුන් අතට පත් කිරීම යි.

සිය සේවා කොන්දේසි සහ වැටුප් වනසා දැමීමටත් පාසල්වලට යටි වල කපා ඒවා පෞද්ගලීකරනය කිරීමටත් විරුද්ධ වන්නට තරම් නිර්භය වන කවර ගුරුවරයෙකුට වුව ද රෝඩ් අයිලන්ඩ්හි දොට්ට දැමීම් තථ්‍ය පාඩමක් ද අනතුරු ඇඟවීමක් ද වනු ඇත.

ගුරුවරුන් කෙරෙහි ඔබාමා පල කරන සතුරුකමෙන් එලිදරව් වන්නේ කම්කරු පන්තික සිසුසිසුවියන් සම්බන්ධයෙන් ඔහු තුල පවතින සැබෑ ආකල්පය යි. දැනට මත් එදිනෙදා තම සිසුන් වෙනුවෙන් ගිනිය නොහැකි තරමේ කැප කිරීම් කරමින් සිටින ගුරුවරුන්, සෙන්ට්‍රල් ෆෝල්ස් වැනි දරිද්‍රතාවෙන් ඇලලී ගිය නගරවල නිදහස් අධ්‍යාපනය බිඳ වැටීමෙහි ලා වගකිව යුතු නැත.

රජයේ පාසල් මිය යන්නට ඉඩ හැර පෞද්ගලිකව පාලනය වන බලපත්‍රලාභී පාසල්වල සහ ලාභ ඉපයීම අරමුනු කර ගත් පාසල්වල වර්ධනය දිරි ගැන්වීමේ ඉලක්කය ඇතිව දශක ගනනාවක් තිස්සේ ආන්ඩුව ක්‍රියාවට නැංවූ ප්‍රතිපත්තිවලින් නොවැලැක්විය හැකි ලෙස හට ගත් ප්‍රතිඵලයේ ගොදුරු ලෙස ඔවුහු

යොදා ගැනෙති. පාසල් වසා දැමීම් ද වනසා දැමීමේ වැඩ සටහන් ද එක් පන්තියක සිටින සිසුන් ප්‍රමාණය වැඩි කිරීම ද සම්බන්ධයෙන් ගුරුවරුන් දෝෂාරෝපනයට ලක් විය යුතු නැත.

එහෙත් ඔබාමා මෙම අධ්‍යාපන විරෝධී න්‍යාය පත්‍රය පුලුල් කරමින් සිටියි. ඔහුගේ පාලනාධිකාරය කැප වී සිටින්නේ රජයේ පාසල් වනසා දමා විධිමත් අධ්‍යාපනයක් ලැබීම සියලු දෙනාගේ අයිතියක් නොව ඉසුරුමතුන්ගේ වරප්‍රසාදයක් බවට පත් කිරීමේ අරමුනෙන් රිපබ්ලිකානු දක්ෂිනාංශය දිගු කලක් තිස්සේ දරා ගෙන ආ ක්‍රියා මාර්ගය මුදුන් පමුනුවා ලීමට ය.

වෝල් වීදියට ඇප වීම සඳහා ගෙවීමට මුදල් සරි කර ගනු වස් රට පුරා රජයේ පාසල් පද්ධතිවල ද ඒ සමග ම අනෙක් අත්‍යවශ්‍ය සමාජ සේවාවන්හි ද කප්පාදු ක්‍රියාත්මක කිරීමට පාලනාධිකාරය පෙරමුන ගෙන සිටී. මෑත දිනවල, පාසල් පරිපාලන මන්ඩල පහත සඳහන් පියවරයන් නිවේදනය කර ඇත:

- ගුරුවරුන් සහ අනෙක් පාසල් සේවකයන් 5,200කට රැකියා අත්හිටුවීමේ නිවේදන යැවීමට පක්ෂව ලොස් ඇන්ජලිස් පාසල් දිස්ත්‍රික්කය මාරතු 02 දා ඡන්දය දුන්නේ ය.

- ගුරුවරුන් සහ අනෙක් සේවකයන් 900කට සමාජවාදී ප්‍රකාශ සහිත ලිපි ලැබෙන බව, සැන් ෆ්‍රැන්සිස්කෝ නිලධාරීහු නිවේදනය කලහ.

- පසු ගිය වසරේ දී ඉලක්ක කර ගත් පාසල් 29ට අමතරව තමන් තවත් පාසල් 40ක් වසා දමන බවත් සිසුන් ප්‍රවාහනය කිරීම පෞද්ගලීකරනය කරන බවත් ඩෙට්‍රොයිට්හි හදිසි මූල්‍ය අධ්‍යක්ෂ රොබට් බොබ් පැවසී ය. මීට කලින්, දෙවසරක් තිස්සේ ඩොලර් 10,000ක වැටුප් කැපීමක් පිලිගෙන සිටීමට දිස්ත්‍රික්කයේ ගුරුවරුන්ට බල කෙරින.

- නගරයේ පාසල් 61න් 29ක් වසා දමා ඒවායේ සේවකයන්ගෙන් හතරෙන් පංගුවක් රැකියාවලින් නෙරපා හරින බව කැන්සාස් ප්‍රාන්තයේ මිසූරි පාසල් දිස්ත්‍රික්කය මෙම සතියේ නිවේදනය කලේ ය.

ගුරුවරුන් දඩයම් කරන පරිපාලකයන්ගෙන් වැඩි දෙනෙක් ඩොලර් සියදහස් ගනනින් වැටුප් ලබන්නෝ ය. ඩෙට්‍රොයිටයේ රොබට් බොබ්ට ඩොලර් 81,000ක වැටුප් වැඩි වීමක් ලැබී ඔහුගේ වැටුප ඩොලර් 425,000ක් බවට පත් විය.

අධ්‍යාපන ලේකම් ඩන්කන් කල අදහස් දැක්වීම් තුල පරිපාලනයේ න්‍යාය පත්‍රය සාරාංශගතව තිබින: නිව් ඕර්ලියන්ස්හි පාසල් පද්ධතියට "සිද්ධ වුනු හොඳ ම දෙය" කට්රිනා චන්ඩ මාරුතය ලඟා වීම යැයි පසු ගිය මාසයෙහි ඔහු කියා සිටියේ ය. රට තුල සිටින රජයේ පාසල් සිසුන්ගෙන් සියයට 60කට ආසන්න ප්‍රමානයක් දැන් බලපත්‍රලාභී පාසල්වලට යති - මෙය වනාහි සියලු ඇමරිකානු නගර හා සසඳා බැලූ විට දක්නට ලැබෙන ඉහල ම ප්‍රතිශතය යි - පාසල් නිලධාරීන්ගේ බලාපොරොත්තුව වන්නේ එලඹෙන වසරවල දී එය සියයට 75 දක්වා වැඩි කිරීම යි.

නිදහස් අධ්‍යාපනය යනු දශක ගනනාවක මහජන අරගල තුලින් කම්කරු පන්තිය අත් කර ගත් ජයග්‍රහනයකි. ආර්ථික තත්ත්වය නොතකා, කවර ජාතියකට හෝ වර්ගයකට අයත් ද යන්න නොතකා නිසි නිදහස් අධ්‍යාපනයක් ලැබීමට සියලු සිසුන්ට ඇති අයිතිය ප්‍රජාතන්ත්‍රවාදයේ කේන්ද්‍රීය සංරචකයක් යැයි දකිනු ලැබින.

ගුරු වෘත්තීය සමිතිවලින් පවත්වා ගෙන යන "සමාජවාදී ව්‍යවසායන්" යැයි රජයේ පාසල් හෙලා දුටු මිල්ටන් ෆ්‍රීඩ්මාන් ඇතුලු බොහෝ දක්ෂිනාංශික දේශපාලන බලවේග දිගු කලක් තිස්සේ සිය ඉලක්කය කර ගෙන සිටින්නේ, නිශ්චිත වශයෙන් ම නිදහස් අධ්‍යාපනයේ මෙම සමානාත්මතාවාදී පැතිකඩ යි. කෙසේ වුව ද, පන්තිය පදනම් කර ගත් අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දීමට ඔවුන් යලි යලිත් දැරූ ප්‍රයත්නවලට "සාමූහික දෘෂ්ටියකින්" යුක්ත වීම සම්බන්ධයෙන් ෆ්‍රීඩ්මාන්ගේ හෙලා දැකීමට බඳුන් වුනු - මහජනතාව වෙතින් බොහෝ අවස්ථාවල දී විරෝධය එල්ල විය.

ඔබාමා පාලනාධිකාරය ක්‍රියාවට නංවමින් සිටින්නේ කලින් රිපබ්ලිකානු දක්ෂිනාංශය හා බැඳී පැවති න්‍යාය පත්‍රය යි. ඩන්කන් සහ මන්ත්‍රන සභාවේ හිටපු රිපබ්ලිකානු කතා නායක නෙව් ගින්ග්රිච් ඒකාබද්ධ වී පාසල් "ප්‍රතිසංස්කරනය" ප්‍රවර්ධනය කිරීම සඳහා කරන ජාතික රැස්වීම් චාරිකාවෙන් මෙය අවධාරනය වේ.

පාලක පන්තියේ විශාල පිරිසක් ඔබාමාගේ තේරී පත් වීමට සහාය දුන්නේ, කම්කරු පන්තිය මත ඓතිහාසික ප්‍රහාර එල්ල කිරීමේ පියවරයන් මුදුන්පත් කර ගැනීමෙහි ලා වෘත්තීය සමිතිවල සහාය ගොනු කර ගැනීම සඳහා ඩිමොක්‍රැටික් පාලනාධිකාරයක් වඩා

හොඳින් සමත් වනු ඇතැයි ඔවුන් තුල යම් විශ්වාසයක් පැවති බැවිනි.

ඇමරිකානු ගුරු සම්මේලනය ද අනෙක් සමිති ද පාලනාධිකාරයේ අධ්‍යාපන විරෝධී සහ ප්‍රජාතන්ත්‍ර විරෝධී න්‍යාය පත්‍රයට එකඟතාව පල කර ඇති අතර, එහි ප්‍රතිඵලය වශයෙන් සමිති නිලධරයන්ගේ තානාන්තර ද ආදායම් පිම්බීම ද සුරක්ෂිත වී ඇත. ඔවුන් රජයේ පාසල් සහ ගුරුවරුන්ගේ රැකියා සහ ජීවන තත්ත්වයන් විනාශ කිරීමේ හවුල්කරුවන් බවට පත් වී ඇත, මෝටර් රථ කම්කරුවන් මත දරිද්‍රතාවට ආසන්න වැටුප් සහ මහා දොට්ට දැමීම් පැටවීමේ දී එක්සත් මෝටර් රථ කම්කරු සමිතිය (යූඒඩබ්ලිව්) මෝටර් රථ සමාගම්වල ව්‍යාපාරික හවුල්කරුවෙකු බවට පත්ව සිටින්නාක් මෙනි.

මෙම ප්‍රහාරවලට එරෙහිව මහජන විරුද්ධත්වය වැඩෙමින් පවතියි. දහස් ගනන් දෙමාපියෝ පාසල් මන්ඩල රැස්වීම්වලට ද පාසල් කප්පාදුවලට විරුද්ධත්වය පෑම සඳහා ද නිව් යොක්යෙහි, මිචිගන්හි, මිසූරිහි ද වෙනත් ප්‍රාන්තවල ද පැවැත්වෙන සංවිධානාත්මක විරෝධතාවලට ද පොදි කකා රැස් වෙති. අද දින, රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතියෙහි අමතර ඉගෙනුම් පංගුව (ටියුෂන්වලින් ලබා ගත යුතු අධ්‍යාපනය) සියයට 32කින් ඉහල දැමීමට ද අධ්‍යාපනයෙහි ලා සිදු වෙමින් පවතින අනෙක් කප්පාදුවලට ද විරුද්ධත්වය පෑම සඳහා කැලිෆෝනියාව සිසාරා පැවැත්වෙන විරෝධතාවලට පාසල් සේවකයන් සමග පෙල ගැසී පාසල් සහ උසස් පාසල් සිසු සිසුවියන් දහස් ගනනක් සහභාගි වනු ඇත.

සියලු දෙනා සඳහා ගුනාත්මක අධ්‍යාපනය සුරක්ෂිත කල හැකි වන්නේ, නිසි වැටුප් සහ ප්‍රතිලාභ ලබා දී ගුරුවරුන් කුලියට ගැනීමට ද එක් පන්තියක සිටින සිසුන් ප්‍රමානය අඩු කිරීමට ද පැරනි පාසල් අලුත්වැඩියා කිරීමට සහ අලුත් පාසල් ගොඩ නැගීමට ද සියලු පාසල් නවතම ඉගෙනුම් ක්‍රම හා මෙවලම්වලින් සන්නද්ධ කිරීමට ද ඩොලර් ට්‍රිලියන ගනනින් මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පමනකි.

මූල්‍ය ප්‍රභූවේ දේශපාලන උපකරනයක් වන ඩිමොක්‍රැටික් පක්ෂය ද ඒ හා සමානව ම රිපබ්ලිකන් පක්ෂය ද එවැනි පියවරයන් කිසි දා ක්‍රියාත්මක කරනු නැත. "වෙනස" සහ "බලාපොරොත්තුව" නියෝජනය කරන බවට ඔබාමාගේ ප්‍රකාශ මත පදනම් වුනු ඔහුගේ මැතිවරන ව්‍යාපාරය වංචාවකි. ඔහු වූකලි සංගතවල බලගතු අවශ්‍යතාවලට අනුව පරෙස්සමින් තෝරාගත් අයෙකි. මන්ද, ඔහු වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවන් කෙරෙහි වඩා සානුකම්පික වනු ඇතැයි සිතීමට පොලඹවා කම්කරුවන් සහ තරුනයන් මුලා කිරීමට ඔහුගේ අප්‍රිකානු ඇමරිකානු පසුබිම යොදා ගත හැකි වනු ඇතැයි ඔවුන් යම් තරමකට ගනන් බැලූ බැවිනි.

ඔහු සිය තනතුරෙහි වැඩ ආරම්භ කිරීමෙන් යන්තම් වසරක් ගත වූ තැන ඔබාමා පාලනාධිකාරය සිය පිලිවෙත් සම්බන්ධයෙන් ඔප්පු කර ඇති දෙය නම් එය නූතන ඇමරිකානු ඉතිහාසයේ වඩාත් ම දක්ෂිනාංශික ආන්ඩුව වන්නට යන බව යි. අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා ඔබාමාට ද මහ ව්‍යාපාරිකයන්ගේ පක්ෂ දෙකට සහ ඒවායින් ආරක්ෂා කෙරෙන ලාභ පද්ධතියට ද එරෙහි ඍජු අරගලයක් අවශ්‍ය ය.

මෙය මුදුන්පත් කර ගත හැකි වන්නේ කම්කරු පන්තියේ ස්වාධීන මහජන පක්ෂයක් ගොඩ නැගීමෙන් පමනකි.

අනෙක් සෑම ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් සේ ම, ගුනාත්මක බවින් උසස් හා නිදහස් අධ්‍යාපනික පාසල් වෙත ප්‍රවේශ වීමේ අවස්ථා සැපයීම ද ධනවාදය නිසා හට ගෙන ඇති අතිමහත් සමාජ අසමානතාව හා නො ගැලපෙයි. මූල්‍ය කතිපයාධිපත්‍යයේ ග්‍රහනය බිඳ දැමීම සඳහාත් පෞද්ගලික ලාභ නො ව මානව අවශ්‍යතා සපුරාලනු වස් ආර්ථික ජීවිතය ප්‍රතිසංවිධානය කිරීම සඳහාත් සමාජයේ මූලික සහ විප්ලවීය පරිවර්තනයක් කල යුතු ය.

කම්කරු පන්තිය ආරක්ෂා කිරීම සඳහා සමාජවාදී ක්‍රියා මාර්ගයක් ද ඒ උදෙසා සටන් වැදීම සඳහා එක්සත් ජනපදය තුල සහ ජාත්‍යන්තරව මහජන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගීම සඳහා වන මූලෝපායක් ද විස්තාරනය කිරීම සඳහා, සමාජවාදී සමානතා පක්ෂය අප්‍රේල් 17 සහ 18 යන දෙදිනෙහි ඩෙට්‍රොයිට්හි දී සමාජ අර්බුදය සහ යුද්ධය පිලිබඳව හදිසි සම්මේලනයක් පවත්වයි. ඊට සහභාගි වන ලෙස අපි අපගේ පාඨකයන්ගෙන්, විශේෂයෙන් ම ගුරුවරුන්ගෙන්, සිසුන්ගෙන්, දෙමාපියන්ගෙන් සහ නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා වන අරගලයෙහි නිමග්නව සිටින සියල්ලන්ගෙන් - අපි ඉල්ලා සිටිමු. වැඩි දුර තොරතුරු හෝ ලියාපදිංචි වීම සඳහා මෙම අන්තර්ජාල සම්බන්ධකය භාවිත කරන්න.

**ජෙරී වයිට්**